# ජී. බී. සේනානායක සහ නිදහස් කාව්‍ය සම්ප්‍රදාය

චින්තා පවිත්‍රානි

G. B. Senanayake could be identified as a poet who was stingy critiqued within the Sinhalese poetic field. He succeeded in signifying his own identity, approaching a different turn than the independent device which prevailed in the second poetic generation of the Colombo era. He introduced free verse to Sinhalese Literature. His short stories and poetic composition titled 'paligenema' is considered a landmark in the Sinhalese poetic field. Therefore, it could be concluded that there lies a possibility of paying special attention to words that identity the poetic dictum of G. B. Senanayake.

© චින්තා පවිත්‍රානි

සංස්. පී. ඒ. අමිල මදුසංක, ජයමල් ද සිල්වා, දිල්ෂාන් මනෝජ් රාජපක්ෂ,
චන්දන රුවන් කුමාර, එච්. ඒ. ගිහාන් මධුසංඛ, නන්දුලා පෙරේරා
**'ප්‍රභා' ශාස්ත්‍රීය සංග්‍රහය, සිවු වැනි කලාපය - 2014/2015**
මානවශාස්ත්‍ර පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය

කාව්‍ය සම්ප්‍රදායක් ක්‍රමයෙන් විකාසනය වීමේ දී නොයෙක් විපර්යාසවලට බඳුන් වන බව පැහැදිලි කරුණකි. විවිධ කවීන්ගේ මෙන් ම කවි පරම්පරාවන්හි සිතුම්පැතුම්, හැදෑරීම් හා ජීවන අත්දැකීම් ද කලින් කලට වෙනස් වේ. සිංහල කවිය ද ආකෘතික හා අන්තර්ගතමය වශයෙන් වරින්වර වෙනස් වෙමින් පුළුල් වෙමින් ඉදිරියට විකාසනය වූවකි. නූතන සිංහල කවියේ ආරම්භය පිළිබඳ නොයෙකුත් මතවාද පවත්නා බව සැබෑ ය. එහෙත් ජී. බී. සේනානායක විසින් හඳුන්වා දෙන ලද නිදහස් කවිය සිංහල කාව්‍ය සම්ප්‍රදායේ විප්ලවීය වෙනසකට තුඩු දුන් බව සුවිශද ය. මොහු හතළිහ දශකයේ මැද භාගයේ දී නිදහස් කවිය (සේනානායක තම කවි නිසඳැස් නමින් හඳුන්වා නැත) හඳුන්වා දෙන්නේ එවකට ජනප්‍රිය ව පැවති කොළඹ කවියට මෙන් ම හෙළහවුලේ කවියට වඩා වෙනස් කාව්‍ය සම්ප්‍රදායක අවශ්‍යතාව ප්‍රබල ලෙස දැනෙමින් පැවති බැවිනි. ඒ. එම්. ජී. සිරිමාන්න එම ප්‍රස්තුතය මෙසේ හඳුනාගනියි.

> **"ළාමක සෞන්දර්යවාදයෙන් හා බොල් භාවෝද්දීපනයෙන් සිංහල කාව්‍ය බැහැර කිරීමට මුලින් වෑයම් කළ ලේඛකයා වශයෙන් ජී. බී. සේනානායක සැලකිය යුතු ය. චින්තනයට මුල්තැන දෙමින් මිනිසාගේ ආධ්‍යාත්මය ගවේෂණය කරන කවි සිංහලෙන් ලිවිය හැකිදැයි ජී. බී. සේනානායක සිය 'පලිගැනීමේ' එන කවිවලින් විමර්ශනය කර ඇත."**[1]

පලිගැනීම (1946) කෘතියෙහි කෙටිකතා අතර පැනෙන කවි සේනානායක විසින් හඳුන්වා දෙන ලද්දේ ගද්‍යයට ද පද්‍යයට ද අතර වන නිබන්ධ විශේෂයක් ලෙස ය.[2] යථෝක්ත ගද්‍යයට ද පද්‍යයට ද අතර වන නිබන්ධ විශේෂයක් ය යන යෙදුම පසුකාලීන ව විචාරකයන්ගේ දැඩි අවධානයට ලක් වේ. සේනානායක අභිනව නිර්මාණ විශේෂය ඍජු ව ම නිදහස් හෝ නිසඳැස් කවි ලෙස හැඳින්වීමට නොපෙලඹුණේ මන්දැයි යන්න විග්‍රහ කිරීමට ඔවුහු යත්න දරූහ. තතු එසේ නම් සේනානායක සිංහල සාහිත්‍යයට හඳුන්වා දුන්නේ ගද්‍යයට ද පද්‍යයට ද අතර වන නිබන්ධ විශේෂයක් බැවින් සිංහල නිදහස් කාව්‍ය සම්ප්‍රදායේ ආරම්භකයා සේනානායක ලෙස හැඳින්වීම පදනම් විරහිත වූවක් ද යන පැනය පැනනැඟිණි.

"නිසඳැසෙහි ආදි කර්තෘ විසින් ඒවා අඳුන්වන ලද්දේ ගද්‍ය පාඨ ලෙසිනි. පද්‍ය විශේෂයක් ලෙසින් නොවේ. එහෙත් නොබෝ කලකින් ම විශ්වවිද්‍යාල ආශ්‍රිත තරුණ පිරිස් අතෙහි එය සිය නව කාව්‍ය ආකෘතියක් බවට පත්වි ය."[3]

සිරි ගුණසිංහ ඒ පිළිබඳ ව ගෙන එන්නේ මෙබඳු අදහසකි.

"සේනානායක තමාගේ රචනාවලට උපයෝගී කරගෙන ඇත්තේ ගද්‍ය භාෂාව නිසා කාව්‍යයට අවශ්‍ය ලක්ෂන ඒ රචනාවල නැහැ. සේනානායකගේ රචනාවලත් නිසඳැස් කවිවලත් ඇති වෙනස ඒකයි. ගද්‍ය පාඨයක් හැටියට එකට සම්බන්ධ කරලා නොලියා පේලි වෙන් කරලා ලියා ඇති නිසා ඒවා ගද්‍ය රචනා හැටියට නොගැනුනත් ඒවා කවි නොවෙයි කියන එක සේනානායක පිලිගත් නිසා තමයි ඒවා ගද්‍යත් නෙවෙයි පද්‍යත් නෙවෙයි කියලා කිව්වෙ."[4]

සේනානායක තම කාව්‍ය නිර්මාණවලට උපයෝගී කර ගෙන ඇත්තේ ගද්‍ය භාෂාව බව සිරි ගුණසිංහ පවසයි. එම කරුණ පිළිබඳ අවධානය යොමු කිරීමේ දී ගද්‍ය භාෂාව හා පද්‍ය භාෂාව අතර පවත්නා විබෙදුම් කඩනය කුමක් ද යන්න හඳුනා ගැනීම වැදගත් ය. රස ජනනය, අපූර්වත්වය, ශබ්දාර්ථ සුසංයෝගය, රමණීය අරුත් ප්‍රතිපාදනය, සංකල්ප රූප මැවීම, වාච්‍යාර්ථය ඉක්මවා යාම, ධ්වනිපූර්ණ බව යනාදි වශයෙන් කාව්‍යමය බස් වහරක පැනෙන මූලික ලක්ෂණ සේනානායකගේ කවිවල ද ගැබ් වේ. එසේ නම් ගුණසිංහ සේනානායකගේ කාව්‍ය නිර්මාණවල ගද්‍ය භාෂාව දක්නට ලැබෙන බව පවසන්නේ කවර නිර්ණායක මත පදනම් ව ද යන්න පැහැදිලි කර ගත යුතු ය. ඒ ඇසුරින් සේනානායකගේ කාව්‍ය රීතියේ අනන්‍යතාව ද විමර්ශනය කිරීමට පුළුවන.

"සේනානායකගේ රචනාවලට පදනම් වුන අදහස් කලාත්මක අතින් අපූර්ව අදහස් උනත්, ඒ රචනාවල

**කවියට අවශ්‍ය උපමා රූපක ආදිය නැති නිසාත් ඒ වගේම කවියට අවශ්‍ය විදිහට සම්පින්ඩනය නැත්නම් සංකෝචනය කල භාෂා ශෛලියක් නැති නිසාත් සේනානායක කවිය කියන වචනය භාවිත නොකර හැරියායි කියලා හිතන්න පුලුවනි."[5]**

නිර්මාණකරණයේ දී තමා උපමා රූපක අඩු වශයෙන් භාවිත කිරීම විචාරක දෝෂදර්ශනයට ලක් වන කරුණක් බව සේනානායකගේ ද අවධානයට හසු විය. උපමා රූපක කිපුණු දඩබල්ලන් රැළක් තමා හඹා එන බව ඔහු පවසා ඇත.[6] එමෙන් ම පලිගැනීම කෘතියෙහි කාව්‍ය නිර්මාණවලට සාපේක්ෂ ව බලන කල ඉන් පසු ව සේනානායක ලියූ දූල්කවුළුව (1973), විදිම් (1975) යන පද්‍ය ග්‍රන්ථවල පැනෙන කාව්‍ය නිර්මාණයන්හි උපමා රූපක වැඩි වශයෙන් හමු වේ. එමෙන් ම මෙහි දී අවශ්‍යයෙන් ම වටහාගත යුතු කරුණක් වන්නේ උපමා රූපක බහුල වීම හෝ ඌන වීම කාව්‍ය නිර්මාණයක සාර්ථකත්වය සංලක්ෂ්‍ය කරන අතිප්‍රබල නිර්ණායකයක් නොවන බවයි. උචිත අයුරින් අපූර්ව ලෙස පරිභාවිත උපමා රූපක, සංකේත ආදිය නිර්මාණකරුවකුගේ අරමුණු සාක්ෂාත්කරණයට පිටුබලයක් විය හැකි බව සැබෑ ය. එහෙත් උපමා බහුල ව යෙදූ පමණින් සාර්ථක කවි ලිවිය නොහේ. එමෙන් ම උපමා රූපකවලින් තොර කවියක බස හුදු ගද්‍ය බස ලෙස සලකා බැහැර කළ හැකි ද නොවේ. උදය මල්ලව ආරච්චි සේනානායකගේ කාව්‍ය භාෂාවේ අනන්‍යතාව හඳුනා ගැනීමට දරන ප්‍රයත්නය පිළිබඳ සාවධාන වීම මෙහි දී වැදගත් වනු නිසැක ය.

**"භාෂා මාධ්‍යය අතින් සේනානායකගේ රචනාවන් තුළ විප්ලවීය ස්වරූපයක් ප්‍රකට නොවන්නේ ඔහුගේ රචනාවන්ට අවශ්‍ය අමුද්‍රව්‍ය මෙන් ම රචන උපක්‍රම ද චිරන්තන සම්භාව්‍ය සාහිත්‍යයෙන් ග්‍රහණය කරගැනීම නිසායැයි සිතීමට ඉඩකඩ ඇත."[7]**

සේනානායක නිදහස් පද්‍ය මාර්ගය තෝරා ගත්තේ පෙරදිග මෙන් ම අපරදිග කාව්‍ය සම්ප්‍රදායන් පිළිබඳ ගැඹුරු අධ්‍යයනයකින් පසු ව බව අවධාරණය කළ යුතු කරුණකි. කොළඹ ආනන්ද

විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය ලබා ඉන් පසු ව කොළඹ මහජන පුස්තකාලය ස්වකීය විශ්වවිද්‍යාලය කොට ගත් ඔහු ද්වීභාෂික උගතකු වීම ඉතා ගැඹුරින් පෙර'පර දෙදිග සාහිත්‍ය කෘති පරිශීලනයට තුඩු දුන් මූලික පදනම වූ බව කිව හැකි ය. සේනානායකගේ සාහිත්‍ය විචාර ග්‍රන්ථ, චරිතාපදාන මෙන් ම දූල්කවුළුව කෘතියට ලියූ විශිෂ්ට පෙරවදනෙන් ද එකී පෝෂණ අවකාශය මැනවින් තහවුරු වේ. තව ද ඕමාර් ඛයියාම්ගේ රුබයියාට් කාව්‍යය සිංහලයට පරිවර්තනය කිරීමේ දී පළ කළ සාමර්ථ්‍යය ද වැදගත් ය. චිරන්තන සම්භාව්‍ය සාහිත්‍යය සම්බන්ධයෙන් ද මොහුගේ හැදෑරීම පුළුල් පරාසයක් දක්වා විහිද යයි. සේනානායක සිදත් සඟරාවේ පැනෙන රීති අනුව කවි ලිවීම විලංගු ලා ගෙන දිවීමට තැත් දැරීමක් බව ස්වයං අධ්‍යයනයෙන් ම වටහා ගත්තෙකි. ආධුනික කවීන් නියත ව ම හැදෑරිය යුතු කෘතියක් ලෙස හෙතෙම නිර්දේශ කරන්නේ කාව්‍යශේඛරයයි. එමෙන් ම ඔහු පොදුජන සම්භාවනාවට පාත්‍ර වූ වෙස්සන්තර ජාතක කාව්‍යය හා පත්තිනි හැල්ල යනාදි කාව්‍ය කෘති හරවත් විචාරයකට භාජන කළේ ය.

එහෙත් පොතපතෙහි ගැලී දිවි ගෙවූ සේනානායක සමාජ අත්දැකීම්වලින් අවම පෝෂණයක් ලැබූ තැනැත්තකු බව තහවුරුවේ. එමෙන් ම ඔහු පුද්ගල සබඳතාවලින් හා සමකාලීන සමාජ සංස්කෘතික ජීවිතයෙන් වියුක්ත ව හුදෙකලා ජීවිතයක් ගත කළ අයෙකි. පුවත්පත්කලාවේ දී අරුක්ගොඩ ලියූ 'මට හමුවූ ලේඛකයෝ' කෘතියෙහි සඳහන් පරිදි දුෂ්කර ආයාසයක් දරා සේනානායක හමුවීමට අවස්ථාවක් ලබාගත් තත් මාධ්‍යවේදියාට ඔහුගෙන් ලැබෙන්නේ මෙබඳු ප්‍රතිචාරයකි.

> **"අල්ලපු ගෙදර අය එක්ක තියා මේ ගෙදර උදවිය එක්කවත් මගේ එහෙමට සම්බන්ධයක් නැහැ. මිනිස්සු අඳුරාගන්ඩ අඳුරාගන්ඩ කරදර වැඩියි. මිනිස්සුන්ගෙන් දුරස් වෙලා ඉන්න තරමට සතුට වැඩියි."[8]**

ඒ නිසා ම සේනානායකගේ නිර්මාණ මාර්ගය වඩාත් ඒකාකාරී වූ අතර ග්‍රන්ථාගත අත්දැකීම්, ග්‍රන්ථාගත ව්‍යවහාරය හා සම්භාව්‍ය සාහිත්‍ය සංකල්ප ආදිය ඔහුට ම අනන්‍ය වූ රීතියක් ගොඩනැංවීමෙහි

ලා බෙහෙවින් ඉවහල් විය. දල් කවුළුව හා විඳිමි යන කාව්‍ය සංග්‍රහ ද්වයෙහි මිනිස් අධ්‍යාත්මය ගවේෂණයට රුකුලක් වන සූක්ෂ්ම නිර්මාණ රැසක් අන්තර්ගත වන නමුදු සමකාලීන සමාජ විශ්ලේෂණය ඒවායේ ගැබ් වූයේ ඉතා අවම වශයෙනි. වික්‍රමසිංහ මේ පිළිබඳ සාකච්ඡා කරමින් සේනානායකගේ කවි "විචාර චින්තා" ලෙස හඳුන්වන්නේ ඒ නිසා විය යුතු ය. එමෙන් ම ඔහු සංකල්ප රූප මැවෙන පරිද්දෙන් ක්ෂුද්‍ර අනුභූතීන් ඉසියුම් ලෙස ප්‍රතිනිර්මාණයෙහි ලා විරල සමත්කමක් දක්වී ය. පහත දක්වෙන නිදර්ශනයෙන් ඒ බැව් සනාථ වේ.

**"තරප්පු පේළියෙ දිගේ**
**මොළොක් පතුලින්**
**ලැසි පියවරින්**
**එන මෙන් උඩුමහලට**
**එයි බටනළා හඬ**
**නැතියෙන් පියබඳක ගෙයි**
**ගියේ මා පසුකොට, බට ලී හඬ**
**කම්මලෙහි තැලෙන මෙන්**
**යකඩය මිටියෙන්**
**තැළෙමි මම**
**බටනළා හඬින්.."**[10]

පෙර නොවූ විරූ ආකාරයේ කාව්‍ය චින්තා සේනානායකයන්ගේ නිර්මාණයන්හි ගැබ් වන ආකාරය මේ අනුව පැහැදිලි වේ. අනෙක් අතට සමකාලීන කවීන් වූ සිරි ගුණසිංහ හා ගුණදාස අමරසේකර විශ්වවිද්‍යාල අධ්‍යාපනය පදනම් කොට ගෙන ගමෙන් නගරයට පිවිස මුහුණ දුන් ප්‍රබල වෛෂයික හා චෛතසික අරගලය සේනානායකට සාධාරණීකරණය නොවී ය. අපරදිග සමාජ පරිස්ථිතියේ සිදු වූ ක්‍රමික වෙනස්වීම් කුළුගැන්වී උද්ගත වන ධනේශ්වරයේ නැගීම, බුද්ධි ප්‍රබෝධය, කාර්මික විප්ලව හා පළමු ලෝක යුද්ධය ආදි විපර්යාසාත්මක අදියරවලින් පසු නිර්මාණකරණයට එළැඹි ටී. එස්. එලියට්, ඩී. එච්. ලෝරන්ස් යනාදි කවීන් ගුණසිංහට හා අමරසේකරට බලපෑ නමුත් නිදහස් කවි නිර්මාණයේ දී සේනානායක ආභාසය ලබන්නේ සෞන්දර්යාත්මක

නැඹුරුවක් සහිත බටහිර කවියකු වූ වෝල්ට් විට්මන්ගෙනි. විට්මන් වනාහි එලියට්, ලෝරන්ස් මෙන් පවත්නා සමාජ යථාර්ථය තියුණු ලෙස නිරූපණය කිරීමකට වඩා සෞන්දර්යාත්මක දෘෂ්ටියකින් හෘදයග්‍රාහී අනුභූතීන් ප්‍රතිනිර්මාණයට වැඩි නැඹුරුවක් දක් වූ කවියෙකි. සමකාලීන සමාජ අනුභූතීන් කෙරෙහි අඩු සංවේදීතාවක් දක් වූ සේනානායන එබඳු කවියකුගෙන් ආභාසය ලැබීම ඔහුගේ විඥ්ඥාණාත්මක සංකල්පමය පදනම තව දුරටත් තිව්‍ර කිරීමට හේතුකාරක වූ බව නිසැක ය. ඔහු මෙසේ පවසයි.

> "වෝල්ට් විට්මන් ඇමරිකා එක්සත් ජනපදයෙහි අසම කවියා කොට සලකනු ලැබේ. 1855 දී ඔහු තණපත් නමැති කාව්‍ය සංග්‍රහයක් ලියා පළ කළේ ය. ඔහුගේ පද්‍ය නිදහස් පද්‍යය. එහෙත් ඔහු තම පද්‍ය හැඳින්වූයේ නිදහස් ගද්‍ය යන නමිනි. මේ නම නිදහස් පද්‍යවල සැටි වටහාගන්ට උපකාර වෙයි. නිදහස් පද්‍ය වනාහි ගද්‍ය නොවේ. සාම්ප්‍රදායික පද්‍යත් නොවේ. ඒ දෙක අතර සිටියි. සාම්ප්‍රදායික පද්‍ය නොවන්නේ ඡන්දසින් නිදහස් හෙයිනි. එහෙත් ඒවා පද්‍ය විශේෂයකි."[11]

සේනානායක පලිගැනීම කෘතියෙහි එන කාව්‍ය නිර්මාණ "ගද්‍යයට ද පද්‍යයට ද අතර වන නිබන්ධ විශේෂයක්" ලෙස හැඳින්වීමේ පදනම මේ විග්‍රහය ඇසුරින් වටහාගත හැකි ය. ඔහු ඒවා ඍජු ව ම පද්‍ය ලෙස හැඳින්වීමට මැලිවීම බොහෝ විචාරකයන්ට ගැටලුවක් වූයේ නමුදු "ගද්‍යයට ද පද්‍යයට ද අතර වන නිබන්ධ විශේෂයක්" යන්න අවිචාරාත්මක ව යොදන ලද්දක් නොවන බව මේ අනුව පැහැදිලි ය. ඔහුගේ කවි බස වනාහි හුදු ගද්‍ය භාෂාවක් නොව ග්‍රන්ථාගත ව්‍යවහාරය හා චිරන්තන සාහිත්‍ය සංකල්පනාවන්හි ප්‍රබල ආභාසය මතින් ගොඩනැගෙන්නක් බව නිරීක්ෂණය කළ හැකි ය. සමකාලීන සමාජ අනුභූති කෙරෙහි සවිඥ්ඥාණික වීමට වඩා විශ්ව සාධාරණ ප්‍රස්තුත හා දාර්ශනික චින්තා යනාදිය ඔහුගේ කාව්‍ය නිර්මාණවලට පිවිසෙන්නේ ග්‍රන්ථ පරිශීලනය කෙරෙහි දක්වූ ප්‍රබල නැඹුරුව හා සමගාමී ව බව හේතු වෙතැ යි කිව හැකි ය.

"සාහිත්‍ය කෘති ලියන්ට ජීවිතය පිළිබඳ පුළුල් දැනුමක් වුවමනාය. මේ දැනුම ලැබිය හැක්කේ පුද්ගලිකව ජීවිතය පිරික්සීමෙන් පමණක් නොවේ. එසේ ලැබිය හැකි දැනුම මඳය. විශාල දැනුමක් ලැබිය හැක්කේ පොතපත කියවීමෙනි. මේ කියවීම නවකතා කාව්‍ය ආදියටම සීමා කළොත් ඒ දැනුම බොහෝ සෙයින් සීමා වෙයි. එහෙයින් මම දර්ශනය, මනෝවිද්‍යාව, මානව විද්‍යාව, සමාජ විද්‍යාව ආදිය පිළිබඳ පොත් බොහෝ සෙයින් කියවීමි."[12]

මෙසේ සාහිත්‍යකරණයට අවැසි දැනුම පෞද්ගලික ව ජීවිතය පිරික්සීමෙන් පමණක් ලැබිය නොහැකි බව ඍජු ව ම පවසන සේනානායක නිර්මාණකරණයේ දී ද එමඟින් ලබන්නේ අවම අභිප්‍රේරණයක් බව පෙන්වා දීමට පුළුවන. ඔහු ලියූ කටහඬ නමැති කාව්‍ය නිර්මාණය පාදක කරගනිමින් ඒ පිළිබඳ තව දුරටත් විමර්ශනය කිරීමට පළුවන.

"රන් කෙන්දෙන්
සිහින් සළුවෙන්
සරසමි
ඈ බඳ
මහමුත්තෙන්
ගෙල
මහ සිල්පින්
රනෙහි බැඳි මැණිකින්
දෙඅත
දුරු රට සුවඳකින්
මුහුණ
මිණි කිකිණි දැලින්
දෙපා"[13]

මෙහි ලා සේනානායක නිරූපණය කරන කථකයා සිය පෙම්වතිය සරසන්නේ සම්භාව්‍ය සාහිත්‍ය සංකල්පනාවන්හි හමුවන ඇඳුම් පැළඳුම් හා සුවඳ විලවුන්වලිනි. මේ හා සන්සන්දනාත්මක ව බලන කල සිරි ගුණසිංහ, ගුණදාස අමරසේකර යන කවීන්ගේ

නිර්මාණවල අපට හමුවන්නේ සාරි, ඔසරි හා දිග ගවුම් ආදියෙන් සැරසුණු පෙම්වතියන් ය. යථෝක්ත කවියේ බස නිරවුල් ය. පැහැදිලි ය සාමාන්‍ය ව්‍යවහාර බසින් දුරස් ය. ජාතක කතා පොත, සද්ධර්මරත්නාවලිය යනාදි චිරන්තන සම්භාව්‍ය සාහිත්‍ය කෘතීන්හි මෙබඳු යෙදුම් බහුල ව හමු වේ. ව්‍යවහාර බසෙහි ගැබ් වන නිරායාසී රිද්මය හෝ ශ්‍රව්‍යගෝචරත්වය මෙහි ලා විශේෂයෙන් හා ආයාසයෙන් අවධාරණය නොකෙරේ. අර්ථයට හා භාවයන්ට අනුව හඬ උස්පහත් කොට කියවීමට පුළුවන. එමෙන් ම පරිභාවිත යෙදුම් ඔස්සේ දෘශ්‍යරූපී බව අවධාරණය කරමින් ප්‍රබල වාග් චිත්‍ර මැවීමට ද කවියා සමත් ය.

මේ හා සාපේක්ෂ ව බලන කල සිරි ගුණසිංහ ග්‍රන්ථාගත හා කාල්පනික චින්තාවන් ඉක්මවා යමින් කාර්යබහුල හා සංකීර්ණ නූතන සමාජ පරිස්ථිතිය යටතේ සංකල්පනීය ප්‍රේමයේ ව්‍යාජය තියුණු ලෙස විනිවිද දකියි. ඔහුගේ 'කාන්තාරය' නම් වූ කවියෙහි මෙසේ කියැවේ.

**ආදරයට ගුලිවී**
**ලැග ඉන්නට**
**අවසරයක් නැත**
**නැත මගෙ පෙම්පිඬ**
**කාලය ආලයෙ තලා දමයි ගෙය**
**සාක්කුවෙන් ගෙන**
**ගනන් කරල දෙන**
**හාදු දෙකයි මුළු දිවියේ උනුසුම"**[14]

සේනානායකගේ කවිවල ගැබ් නොවූ විප්ලවීයත්වයක් ගුණසිංහගේ නිර්මාණවල දැකීමට බොහෝ විචාරකයන් පෙලඹෙන්නේ මන්දැයි මේ අනුව පැහැදිලි කර ගත හැකි ය. සේනානායක විසින් මහත් වෑයමින් ගොඩනංවන ලද සෞන්දර්යාත්මක සංකල්ප හා දාර්ශනික චින්තා සියල්ල තියුණු අන්තර්දෘෂ්ටියකින් විනිවිද දැකීමට ගුණසිංහ සමත් ය. ඔහු ඒවා සමකාලීන සමාජ පරිස්ථිතියේ පරාරෝපිත ව දිවි ගෙවන පුද්ගල ජීවන චර්යාවන්හි යථාර්ථය සමඟ උත්ප්‍රාසාත්මක ව ගළපයි. සේනානායකගේ කවි ගද්‍ය භාෂාවට සමීප වීමට තුඩු දුන් හේතුවක් ලෙස තමා ම විග්‍රහ කළ උපමා රූපකවලින් තොර වීමේ

ගුණයෙන් ස්වකීය කාව්‍ය නිදහස් කර ගැනීමට ගුනසිංහ සමත් ය. නවතාවෙන් යුත් අපූර්ව උපමා රූපක හා සංකේත ආදිය ගුණසිංහගේ කාව්‍ය නිර්මාණවල බහුල ව හමු වේ. තියුණු වාගාලාප, නිරායාසී රිද්මය, සම්ප්‍රදාය නව්‍ය අර්ථයකින් ප්‍රතිනිර්මාණය කිරීම යනාදි ලක්ෂණ ඔහුගේ කවිවල ප්‍රබලතාව කෙරෙහි බෙහෙවින් බලපා ඇත. සේනානායක දල්කවුලුව කෘතියෙහි පැනෙන කවි නිදහස් පද්‍ය ලෙස හඳුන්වා දුන් අතර ගුණසිංහ මස් ලේ නැති ඇට කාව්‍ය ග්‍රන්ථයෙහි ඇතුළත් කවි නිසඳැස් කවි ලෙස හඳුන්වා දුන්නේ ය. තත් කවීන් දෙදෙනා ම නිදහස් හා නිසඳැස් කවි යන යෙදුම් භාවිත කරන්නේ සාම්ප්‍රදායික ඡන්දස් අලංකාරවලින් නිදහස් ය යන අර්ථය මත පදනම් ව ය.

> **"නිදහස් පද්‍යයෙහි නියමිත ගණ නැත්තෙන් කියවන විට ඇති වන්නේ මිහිරි ලෙස කියවන්ට වෑයම් කිරීමේදී ඇති වන තාලයයි."**[15]

> **"නිසඳැස් යන්නෙන් අදහස් කෙරෙන්නේ පාරම්පරික ඡන්දෝලංකාර ආදිය නැති කවි යන්නයි."**[16]

මේ ඇසුරින් සනාථ වන්නේ තත්කාලීන කවීන්ගේ එළැඹුම හා සන්සන්දනාත්මක ව බලන කල සේනානායකගේ කාව්‍ය ක්‍රමයේ විශේෂ අනන්‍යතාවක් ගැබ් ව පවත්නා බවයි. යථෝක්ත විග්‍රහය අනුව ඒ හා සබැඳි මූලික පදනම වටහා ගත හැකි ය. ඍජු ව ම සේනානායකගේ ආභාසය විශද කළ කවීන් බිහි නොවූ ව ද ඔහුගේ නිර්මාණාත්මක අත්හදාබැලීම් පසුකාලීන කවීන්ට මහත් ආලෝකයක් වූ බව සනාථ වේ.

## ආන්තික සටහන්

1. සිරිමාන්න, ඒ. එම්. ජී. (1985) **නූතන සිංහල කවියේ බටහිර ආභාසය.** ජී. බී. සේනානායක ප්‍රභාෂණය, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, 167 පිට.
2. සේනානායක, ජී. බී. (1964) **පලිගැනීම**. මුදුන්ගොඩ: තරංග ප්‍රකාශකයෝ. 162 පිට.
3. අමරසේකර, ගුණදාස (1992) **භාවගීත**. කොට්ටාව: සාර ප්‍රකාශන. 16 පිට.
4. ගුනසිංහ, සිරි (1998) **මස් ලේ නැති ඇට**. කොළඹ 10: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ. xxi පිට.
5. එම. එම පිට.
6. සේනානායක, ජී. බී. (1995) **මම එදා සහ අද**. කොළඹ 10: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ. 113 පිට.
7. මල්ලව ආරච්චි, උදය (1985) **ජී. බී. සේනානායක කාව්‍ය රීතියේ අනන්‍යතාව.** ජී. බී. සේනානායක ප්‍රභාෂණය, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ. 372 පිට.
8. සිළුමිණ. 2010. 09. 19. 7 පිට.
9. වික්‍රමසිංහ, මාර්ටින් (1959) **නව පද්‍ය සිංහලය**. මහරගම: සමන් මුද්‍රණාලය. 87 පිට.
10. සේනානායක, ජී. බී. (1973) **දූල්කවුලුව**. කොළඹ: ප්‍රදීප ප්‍රකාශකයෝ. 24 පිට.
11. සේනානායක, ජී. බී. (1975 **විඳිම්**. කොළඹ: ප්‍රදීප ප්‍රකාශකයෝ. 92 පිට.
12. සේනානායක, ජී. බී. (1982) **සාහිත්‍ය දර්ශන සිතිවිලි**. කොළඹ 10: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ. 146 පිට.
13. **දූල්කවුලුව**. 143 පිට.
14. **මස් ලේ නැති ඇට**. 6 පිට.
15. **දූල්කවුලුව**. 17 පිට.
16. **මස් ලේ නැති ඇට**. xxiii පිට.

## මූලාශ්‍රය නාමාවලිය

අමරසේකර, ගුණදාස (1992) **භාවගීත.** කොට්ටාව: සාර ප්‍රකාශන.

ගුනසිංහ, සිරි (1998) **මස් ලේ නැති ඇට.** කොළඹ 10: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

මල්ලව ආරච්චි, උදය (1985) **ජී. බී. සේනානායකගේ කාව්‍ය. ජී. බී. සේනානායක ප්‍රභාෂණය**, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

වික්‍රමසිංහ, මාර්ටින් (1959) **නව පද්‍ය සිංහලය.** මහරගම: සමන් මුද්‍රණාලය.

සේනානායක, ජී. බී. (1964) **පලිගැනීම**. මුදුන්ගොඩ: තරංග ප්‍රකාශකයෝ.

එම (1973) **දූල්කවුලුව.** කොළඹ: ප්‍රදීප ප්‍රකාශකයෝ.

එම (1975) **විඳිම්.** කොළඹ: ප්‍රදීප ප්‍රකාශකයෝ.

එම (1982) **සාහිත්‍ය දර්ශන සිතිවිලි.** කොළඹ 10: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

එම (1995) **මම එදා සහ අද.** කොළඹ 10: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

සිළුමිණ. 2010. 09. 19. 7 පිට.